පානදුර

ශ්‍රී සුමංගල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය

ආරම්භය 1922

# සංවත්සර මහා සභාව

2024 ජූනි මස 29 වන සෙනසුරාදා දින

පෙරවරු 8.30 ට

විද්‍යාලයීය පරිශ්‍රයේ දී

රාත්‍රී සුහද හමුව සහ භෝජන සංග්‍රහය

පස්වරු 6.30 ට

ගොරකාන Ramadia Ranmal නිවාඩු නිකේතනයේ දී

ප්‍රධාන ආරාධිතයාණෝ

කීර්තිමත් ආදි ශිෂ්‍ය

ස්වාධීන රූපවාහිනී සේවයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සරත් කුමාර පෙරේරා මැතිතුමා

## වාර්ෂික මහ සභාව සහ සුහද හමුව

ශ්‍රී සුමංගල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ 2023/24 පරිපාලන වර්ෂය අවසන් කිරීමේ හා 2024/25 පරිපාලන වර්ෂය සඳහා විධායක සභාව තෝරා පත් කර ගනු ලබන සංවත්සර මහා සභා රැස්වීම 2024-06-29 වන දින පෙරවරු 8.30 ට විද්‍යාලයීය පරිශ්‍රයේ දී ද, සංවත්සර උත්සවය හා රාත්‍රී භෝජන සංග්‍රහය ප.ව. 6.30 ට ගොරකාන Ramadia Ranmal නිවාඩු නිකේතනයේ දී ද, පැවැත්වේ.

## වාර්ෂික මහ සභා රැස්වීමේ න්‍යාය පත්‍රය

පෙ.ව. 8.30 ජාතික, බෞද්ධ, පාසල් ධජ ස්ථම්භගත කිරීම.
පෙ.ව. 8.35 ජාතික ගීය වාදනය.
පෙ.ව. 8.45 රැස්වීම් ශාලාවට පිවිසීම.
පෙ.ව. 8.50 පන්සිල් සමාදන් වීම සහ පැවිදි අනුශාසනාව.
පෙ.ව. 9.00 පාසල් ගීතය වාදනය කිරීම.
පෙ.ව. 9.05 ආභාවප්‍රාප්ත ආදි කතෘවරුන්, ගුරුවරුන්, ආදි සිසුන් හා රණවිරුවන් සිහි කිරීම.
පෙ.ව. 9.06 පිළිගැනීමේ කතාව.
පෙ.ව. 9.15 ගරු විදුහල්පතිතුමාගේ කතාව.
පෙ.ව. 9.30 ශාඛා සංගම්හි සභාපති/නියෝජිත මහත්වරුන්ගේ කතා.
පෙ.ව. 10.00 ලැබුණු ලිපි කියවීම.
පෙ.ව. 10.10 2023 සංවත්සර මහ සභා වාර්තාව සභාගත කිරීම හා සම්මත කර ගැනීම.
පෙ.ව. 10.20 2023 අයවැය වාර්තාව සභාගත කිරීම හා සම්මත කර ගැනීම.
පෙ.ව. 10.30 අදහස් සහ යෝජනා.
පෙ.ව. 11.30 නිල කාලය අවසානය සහ ස්තූති කතාව.
පෙ.ව. 11.40 වැඩ බලන සභාපතිවරයෙකු පත්කර ගැනීම.
පෙ.ව. 11.45 2024/2025 වසර සඳහා නව නිලධාරී මණ්ඩලය පත්කර ගැනීම.
ප.ව. 12.00 ගිණුම් පරීක්ෂකවරයෙකු පත්කර ගැනීම.
ප.ව. 12.05 ගරු සමලේකම්තුමාගේ ස්තුති කතාව.
ප.ව. 12.10 රැස්වීමේ නිමාව සහ සභාව විසිර යාම.

## රාත්‍රී සුහද හමුවේ න්‍යාය පත්‍රය

| | |
|---|---|
| ප.ව. 6.30 | සම්භාවනීය අමුත්තන් ශාලාවට කැඳවාගෙන ඒම. |
| ප.ව. 6.35 | චිරාගත සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දැල්වීම |
| ප.ව. 6.40 | විදුහල් ගීතය ගායනා කිරීම. |
| ප.ව. 6.45 | උත්සව සභාව පිළිගැනීම (ගරු සභාපතිතුමා). |
| ප.ව. 6.50 | ප්‍රධාන ආරාධිත අමුත්තාගේ කතාව. |
| ප.ව. 7.00 | ගරු සමලේකම්තුමාගේ කතාව. |
| ප.ව. 8.05 | රාත්‍රී භෝජන සංග්‍රහය ආරම්භය. |

## 2023-2024 නිලධාරී මණ්ඩලය

| | | |
|---|---|---|
| ගරු පැවිදි අනුශාසක | - | මහාචාර්යය පූජ්‍ය කහපොල සුගතරතන නායක මාහිමිපාණන්. |
| ගරු අනුශාසකවරු | - | ගරු විදුහල්පති රවීන්ද්‍ර පුෂ්පකුමාර මහතා<br>පෙර සිංහාධිපති රොහාන්තා ද ෆොන්සේකා මහතා.<br>තිස්ස ඉලේපෙරුම මහතා<br>සරත් අල්විස් මහතා.<br>ඒ.ඩී. ගුණසේකර මහතා<br>තිලක් රෝහිත සිල්වා මහතා. |
| ගරු උපදේශකවරු | - | විශ්‍රාමික විදුහල්පති විල්සන් කහඳගමගේ මහතා.<br>අනුරත් අබේරත්න මහතා.<br>විජිත් සල්ගාදු මහතා.<br>සනත් ද සිල්වා මහතා.<br>මහේෂ් ෆොන්සේකා මහතා. |
| ගරු සභාපති | - | අරවින්ද පෙරේරා මහතා. |
| ගරු සමලේකම්වරු | - | දිනේෂ් කැටිපෙආරච්චි මහතා.<br>ධනුක කොට්ටහච්චි මහතා. |
| ගරු භාණ්ඩාගාරික | - | ප්‍රභාත් තාරක මහතා. |
| ගරු උප භාණ්ඩාගාරික | - | නුවන් රණමයුර මහතා. |
| ගරු සමාජ කටයුතු ලේකම් | - | චන්න ධම්මික මහතා. |
| ගරු සංස්කාරක | - | මනෝජ් ප්‍රසන්න පිරිස් මහතා. |

ගරු නීති උපදේශක - 1. නීතීඥ සුදේශ් චතුර මහතා.(විදේශගත වීම සඳහා ඉල්ලා අස්විය)
2. නීතීඥ නුවන් ගමගේ මහතා.

ගරු උප සභාපතිවරු - 1. අමිල නාවලගේ මහතා.
2. කුමාරසිරි බෝදරගමගේ මහතා.
3. පද්මාල් ගුණරත්න මහතා.
4. මධුසංක නාමසේන මහතා.
5. චමත් ඩයස් මහතා.
6. සුමේධ වී. පෙරේරා මහතා.
7. දිලීක මදුරංග මහතා.
8. කසුන් හේවගේ මහතා.
9. චාමර පීරිස් මහතා.
10. සමීර ගුණතිලක මහතා
11. නිලුක ඉරෝෂන ප්‍රනාන්දු මහතා

ගරු කාරක සභිකවරුන් - 1. ජනක සුදාර පෙරේරා මහතා.
2. දිනේෂ් අබේපාල මහතා.
3. ඩබ්ලිව් ඒ අමරලංකා මහතා.
4. රජීව් ප්‍රනාන්දු මහතා.
5. බන්දු ලක්සිරි මහතා.
6. විශ්ව ජයතුංග මහතා.
7. දිනේෂ් සිල්වා මහතා.
8. සුරේෂ් ඉෂාන් ප්‍රනාන්දු මහතා.
9. නදුන් දර්ශන ජයසේකර මහතා.
10. ධනුෂ්ක සංජය ප්‍රනාන්දු මහතා.
11. මධුෂාන් අසංක ප්‍රනාන්දු මහතා.
12. අරුණ පෙරේරා මහතා.
13. මධුර ප්‍රනාන්දු මහතා.
14. ශිරාන් සේනානායක මහතා.
15. රොෂාන් සේනාරත්න මහතා
16. පසන් මදුක පරේරා මහතා.
17. නිරංග විශ්වනාත් මහතා.
18. ශිහාන් ප්‍රනාන්දු මහතා.
19. රවීන්ද්‍ර රුබේරු මහතා.
20. දුෂාන්ත චානක පෙරේරා මහතා.
21. කපිල ප්‍රදීප් කුමාර මහතා.
22. ඉන්දික විජේනායක මහතා.
23. ජනක චිත්‍රානන්ද මහතා.
24. ලිෂාන් අමරසේකර මහතා.
25. සිරිමන්ත රණසූරිය මහතා.
26. රුවන් චාමර මහතා.
27. සුරංග මංජුල මහතා.
28. රුචිර ධනුෂ්ක ගොරකාන මහතා.
29. ධනුෂ්ක සමීර සොයිසා මහතා.
30. චන්දන සම්පත් විතාරණ මහතා.
31. මොහාන් සමීර සිල්වා මහතා.
32. එච්. ඞී. ශිරාන් මධුරංග මහතා.

33. චරිත ගුණතිලක මහතා. (විදේශගත වීම සඳහා ඉල්ලා අස්විය)
34. චානක මීගොඩ මහතා. (විදේශගත වීම සඳහා ඉල්ලා අස්විය)
35. භාෂිත වීරතුංග මහතා. (පුද්ගලික හේතු මත ඉල්ලා අස්විය)

කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය නියෝජනය කරන සාමාජිකයින්

1. මලිත් සිල්වා මහතා.
2. මාලිංග ලක්ෂාන් මහතා.
3. සුපුන් මධුෂ මහතා.
4. ගයාන් ධනුෂ්ක මහතා.
5. පමුදිත දුලාන්ජ මහතා.
6. අසේල රුක්ෂාන් මහතා.
7. අසිත් දිල්රුවන් මහතා.

## සංවත්සර වාර්තාව

2023 ජුනි මස 24 වන දින ශ්‍රී සුමංගල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ 101 වන වසරට අදාළ මහ සභා රැස්වීම පෙ.ව. 8.30 ට සංගමයේ ගරු සභාපති අරවින්ද පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී ආරම්භ විය. විශාල සාමාජික පිරිසගේ සහභාගීත්වයෙන් පැවති මහ සභා රැස්වීම අවසානයේ දී 2023-2024 පරිපාලන වර්ෂය සඳහා නිලධාරීන් තෝරා පත් කර ගත් අතර එම විධායක සභාවේ සභාපතිවරයා ලෙස හිටපු සභාපති අරවින්ද පෙරේරා මහතාවම සියලු දෙනාගේ එකගත්වයෙන් තෝරා පත්කර ගන්නා ලදි.

2023 - 2024 පරිපාලන වර්ෂය තුළ ආදි ශිෂ්‍ය සංගමය මගින් පාසල වෙනුවෙන්, ආදි සිසුන් වෙනුවෙන් හා ප්‍රජාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් සිදු කිරීමට අපට හැකි විය.

ඒ අතුරින් පහත සේවාවන් සුවිශේෂී වේ.

- 2024 වර්ෂයේ නිවාසාන්තර ක්‍රීඩා උළෙලට අනුග්‍රාහකත්වය දැක්වීම. (සමස්ථ ඇස්තමේතුවෙන් රුපියල් 600,000/- පමණ)

- උසස් පෙළ සමත්ව විශ්ව විද්‍යාල වරම් ලැබූ දරුවන් වෙනුවෙන් පාසල සමග එක් වී උපහාර හා තිළිණ ප්‍රදාන උළෙලක් සංවිධාන කිරීම හා ඒ සඳහා අනුග්‍රාහකත්වයක් දැක්වීම.

- ශ්‍රී සුමංගල මොරටු රන් සටන වෙනුවෙන් රු. 250,000/- ක අනුග්‍රහකත්වයක් දැක්වීම හා රු. 2,350,000/- ක මූල්‍ය අනුග්‍රාහකත්ව සම්බන්ධීකරණය කිරීම.

- විදුහල්පති නිල නිවස රු. 660,000/- ක මුදලක් වැය කර ප්‍රතිසංස්කරණය කිරීම.

- පාසල තුළ කැඩී බිඳී තිබූ ඩෙස් පුටු ප්‍රතිසංස්කරණය කිරීම (සමස්ථ වටිනාකම රු. 300,000/- කට අධික)

- විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කර දීම (රු. 275,000/- ක් පමණ)

- පාසල් සිසුන්ගේ දත්ත කළමනාකරණය කිරීම සහ දෙමාපියන් සම්බන්ධීකරණය කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම සඳහා මූලික පියවර ආරම්භ කිරීම (School Management System)

- විද්‍යාලයේ පුස්තකාලය ආශ්‍රිත ගොඩනැගිල්ලේ කෘමීන් මර්ධනය සඳහා රු. 115,000/- ක පමණ මුදලක් වැය කිරීම.

- විද්‍යාලයීය 115 වන සංවත්සරය නිමිත්තෙන් පැවති පිරිත් පිංකම සඳහා ස්වාමීන් වහන්සේලාට මුදල් හා ද්‍රව්‍යමය පිරිකර ලබා දීම සහ අදාළ දිනයේ දී සමස්ථ පාසලම ආලෝකකරණ කටයුතු සිදු කිරීම. (රු. 500,000/-ක පමණ මුදලක්)

- පරිගණක විද්‍යාගාර දෙකක් Network කිරීම, Laptop පරිගණක 16 ක් හා Desktop පරිගණක 20 ක් පරිත්‍යාග කිරීම.

- ශිෂ්‍ය නායක දින උත්සවය සඳහා රු. 250,000/- ක අනුග්‍රාහකත්වයක් දැක්වීම. (UAE ශාඛාවෙන් රු.50,000/- ක දායකත්වයක් ලැබීම.)

- පාසල තුළ හරිත වටපිටාව විධිමත් කිරීම සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම. (රු. 200,000/- ක් පමණ)

- සිසුන්ගේ ආකල්ප වර්ධනය සඳහා ප්‍රවීන ගීත රචක ධම්මික බණ්ඩාර මහතා ගෙන්වා වැඩමුළුවක් පැවැත්වීම. (රු. 40,000/-)

- විද්‍යාලයීය ගණිත අංශයෙන් ප්‍රථම ස්ථානය ලබා ගත් සිසුවා වෙනුවෙන් රු. 350,000/- ක් පමණ වටිනා Laptop පරිගණකයක් ලබා දීම සම්බන්ධීකරණය කිරීම.

- සමස්ථ ලංකා ඉංග්‍රීසි කමීක තරගය සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම.

- විද්‍යාලයීය හදිසි ප්‍රතිසංස්කරණ කටයුතු සහ සනීපාරක්ෂක කටයුතු සඳහා මූල්‍ය දායකත්වය ලබා දීම. (රු.200,000/- ක් පමණ)

- විද්‍යාලයේ විවිධ අංශ මගින් පවත්වන ලද සියලුම උත්සව සහ වැඩමුළු සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය සහ සම්පත් දායකත්වය ලබා දීම. (රු. 400,000/- ක් පමණ)

- අධ්‍යන කාර්යය මණ්ඩල දීමනා සහ ගුරුවරුන්ගේ අභිප්‍රේරණ වැඩසටහන (සංගමය වැය කළ සමස්ථ මුදල රු. 600,000/-)

- සුව පියස වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ඖෂධ සහ උපකරණ ලබා දීම.

- පොසොන් භක්ති ගීත ගායනා වැඩසටහන සඳහා අනුග්‍රාහකත්වයක් දැක්වීම.

- සමස්ථ ලංකා අන්තර් පාඨශාලයීය චෙස් තරගාවලිය සඳහා මූල්‍ය දායකත්වයක් ලබා දීම හා එමගින් ලැබූ ආදායමෙන් පාසලේ චෙස් ක්‍රීඩකයින් සඳහා පරිශ්‍රයක් සැකසීමට දායක වීම.

- ප්‍රාථමික අංශයේ දරුවන්ගේ මානසික ඒකාග්‍රතාවය වැඩි දියුණු කිරීම සඳහා කැනේඩියානු ජාතික Bettina Melendez මහාචාර්යවරියක් සම්බන්ධ කොට වැඩමුළුවක් පැවැත්වීම.

- ආදි ශිෂ්‍ය සාමාජිකත්ව දත්ත ගබඩාව (Data Base) යාවත්කාලීන කිරීම. (රු.150,000/-ක් පමණ)

- සාමාජිකයින් එක්රැස් කිරීම සඳහා වාර්ෂික සුහද හමුවක් සංවිධානය කිරීම හා එහිදී හිටපු වැඩබලන විදුහල්පති, විද්‍යාලයේ ශිෂ්‍ය භට බළණ්ඩය හා බාලදක්ෂ බළණ්ඩය භාරව විශාල මෙහෙවරක් කළ කීර්තිමත් ආදි ශිෂ්‍ය පද්මලාල් පෙරේරා මහතා ඇගයීම.

- ආදි ශිෂ්‍ය දිනය වෙනුවෙන් පානදුර ප්‍රදේශයේ පවතින ළමා හා වැඩිහිටි නිවාස සඳහා දිවා හා රාත්‍රී ආහාර ලබා දීම.

- ආදි ශිෂ්‍ය දිනයට සමගාමීව ලේ දන් දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

ඉහත සේවාවන්ට අමතරව විශාල සේවාවක් සංගමය විසින් මෙම වසරේ පාසලට සිදු කරන ලදි. සංගමයේ පසුගිය වසරේ කාර්යය සහ කර්තව්‍යයන් සවිස්තරව පහත පරිදි වේ.

## ❖ <u>නිවාසාන්තර ක්‍රීඩා උළෙල</u>

අප විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රීඩා උළෙල 2024 අප්‍රේල් මාසයේ දී පවත්වන ලද අතර ඒ සඳහා අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ බොහෝ ප්‍රමාණයක් අප සංගමය විසින් පාසලට ලබා දීමට කටයුතු කරන ලදි. එමෙන්ම මෙම ක්‍රීඩා උත්සවයේදී පවත්වන ලද සියලුම කේවල තරග ජයග්‍රාහකයින් සඳහා අවශ්‍ය වන රන්, රිදී, ලෝකඩ පදක්කම් හා සියලුම වයස් කාණ්ඩවල ශූරතාවය දිනා ගත් දරුවන්ට කුසලාන ලබා දීමට අප සංගමයට හැකි විය. තවද, ජයග්‍රාහී දරුවන්ට පිරිනමන සියලුම සහතික පත් කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය සම්බන්ධීකරණය කොට ලබා දීමට හැකි විය.

එමෙන්ම විද්‍යාලයට බොහෝ කාලයක සිට අවශ්‍යතාවයක්ව පැවති අලංකාරවත් ක්‍රීඩා පහනක්, නැවත නැවත් භාවිතා කළ හැකි පරිදි අප සංගමයේ උප සභාපති මධුශංක නාමසේන මහතාගේ පුද්ගලික ධන පරිත්‍යාගයෙන් සකසා දෙන ලදි.

මෙම උත්සවයට අවශ්‍ය ආරාධනා පත්‍ර, ශබ්දවාහිනී යන්ත්‍ර සහ රාත්‍රී ආලේක පහන් සැපයීම ද අප සංගමයේ අනුග්‍රාහකත්වයෙන් සිදු විය.

එමෙන්ම මැරතන් ධාවන තරගය සහ පාසලේ අධ්‍යන අනධ්‍යන දෙමව්පිය ආදි ශිෂ්‍ය ආරාධිත පාසල් වෙනුවෙන් පැවති තරග සඳහා මූල්‍යමය තිළිණ ලබා දීම ද අප සංගමයේ අනුග්‍රහයෙන් සහ කීර්තිමත් ආදි ශිෂ්‍ය සුජිත් පෙරේරා මහතාගේ අනුග්‍රහයෙන් සිදු කරන ලදි.

මෙම ක්‍රීඩා උළෙලේ අවසන් දින උත්සවයේ විශේෂ ආරාධිතයෙකු ලෙස 19 න් පහළ ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කළ විද්‍යාලයේ කීර්තිමත් වත්මන් ක්‍රිකට් ක්‍රීඩක විශ්ව ලහිරු සිසුවාව ඇගයීමට ලක් කිරීමට අපට හැකි වූ අතර එහි ප්‍රධාන ආරාධිතයා ලෙස ආදි ක්‍රිකට් ක්‍රීඩක හා ආදි ක්‍රිකට් ක්‍රිඩකයින්ගේ සංගමයේ අනුශාසක වත්මන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ උප සභාපති රවීන් වික්‍රමරත්න මහතාවත් විශේෂ ආරාධිතයා ලෙස ආදි ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ සංගමයේ හිටපු සභාපති මංජුල සිල්වා මහතාවත් කැඳවාගෙන ඒමට අපට හැකි විය.

වොලිබෝල් තරග විනිශ්වය කිරීම සඳහා ආදි වොලිබෝල් ක්‍රීඩකයින් සම්බන්ධ කර දීමටත් ධාවන පත සැකසීම සඳහා අවශ්‍ය සියලු ද්‍රව්‍ය ලබා දීමටත් සහ එය මෙහෙයවීමටත් ආදි ශිෂ්‍ය සංගමයේ මැදිහත්වීම සිදු විය.

ඉහත සඳහන් කටයුතු සඳහා විද්‍යාලය විසින් රුපියල් ලක්ෂ හය (රු.600,000/-) කට වැඩි ඇස්තමේන්තුවක් සකසා තිබූ අතර ආදි ශිෂ්‍ය සංගමය මෙහෙයවීමෙන් ඇස්තමේන්තුවට ආදාළ සියලු කටයුතු සාර්ථකව නිම කර දෙන ලදි.

මෙම ක්‍රිඩා උත්සවය සාර්ථක කර ගැනීම සඳහා උප සභාපතිවරුන් වන චමත් ඩයස්, කුමාරසිරි බෝදරගම, කසුන් හේවගේ, පද්මා ගුණරත්න, දිලීක මධුරංග, නිලුක ඉරෝෂන යන මහත්වරුන් දැක්වූ දායකත්වයත් කමිටු සාමාජිකයින් වන අමරලංකා, කපිල කුමාර යන මහත්වරුන් දැක්වූ සහයෝගයත් කෘතවේදීව සිහිපත් කරමු.

## ❖ <u>පරිගනක විද්‍යාගාරය නවීකරණය</u>

තොරතුරු තාක්ෂණය විෂය හැදෑරීම සඳහා විද්‍යාලයීය දරුවන්ගේ රුචිකත්වය සීඝ්‍රයෙන් වර්ධනය වූවද පාසලේ පරිගණක විද්‍යාගාර ඊට සාපේක්ෂව නව්‍යකරණය නොවීම හේතුවෙන්

සුමඟුල් පුතුන් දැඩි පීඩාවට පත් වන බව ආදි ශිෂ්‍ය සංගමයේ තොරතුරු තාක්ෂණ කමිටුවේ ඇස ගැටිණි.

හොඳම දේ දරුවන්ට ලබා දීම අරමුණු කරගත් ආදි ශිෂ්‍ය සංගමයේ මැදිහත් වීමෙන් විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ පහසුකම් ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව වර්ධන කිරීමට තීරණය කරන ලදී.

මෙහි පළමු අදියරේදී රුපියල් මිලියන දෙක (රු. 2,000,000/-) කට අධික වටිනාකමක් ඇති ලැප්ටොප් පරිගනක (Laptops) 16 ක් සහ නවීන ප්‍රොජෙක්ටර් (Projector) යන්ත්‍රයක් ආදි ශිෂ්‍ය සංගමයේ මැදිහත් වීමෙන් ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවර පදිංචිව සිටින 96 උසස් පෙළ කණ්ඩායමේ මයුර විදිරිසිංහ මහතා විසින් සිසු අයිතියට ලබා දෙන ලදී.

එහි දෙවන අදියර වශයෙන් රුපියල් ලක්ෂ පහළවකට (රු. 1,500,000/-) අධික පිරිවැයක් දරා උසස් මට්ටමේ නව පරිගනක (Desktops) 20 ක් සපයා දීමටත් පරිගනක විද්‍යාගාර අලුතින් ජාලගත (Network) කිරීමටත්, ආදි ශිෂ්‍ය සංගමයට හැකි විය.

මෙම සම්පූර්ණ ව්‍යාපෘති වටිනාකම රුපියල් ලක්ෂ තිස්පහ (රු. 3,500,000/-) කට අධික වේ.

මෙම සුවිශාල ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම උදෙසා ආදි ශිෂ්‍ය සංගමය වෙනුවෙන් පද්මාල් ගුණරත්න මහතා, දිනේෂ් සිල්වා මහතා, චාමර පීරිස් මහතා, චමත් ඩයස් මහතා සමීර ගුණතිලක මහතා සහ දිනේෂ් කැටපෙආරච්චි මහතා සම්බන්ධීකරණ කටයුතු සහ සම්පත් දායකත්වයෙන් දැරූ දායකත්වය අප්‍රමාණය.

ඉදිරියේදී පාසලේ ප්‍රධාන පරිගනක විද්‍යාගාරයේ නඩත්තු කටයුතු නැවුරබ් සමූහ ව්‍යාපාරයේ පූර්ණ අනුග්‍රහකත්වය යටතේ සිදු කිරීමට නියමිතය.

මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වයට දායක වූ දෙස් විදෙස් හී සිටින සියලුම ආදි ශිෂ්‍යයන්ට සහ සුභ පතන්නන්ට ආදි ශිෂ්‍ය සංගමය කෘතවේදීත්වය පලකර සිටී.

## ❖ <u>ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය සඳහා සංගමයේ මෙහෙවර</u>

විද්‍යාලයේ ක්‍රිකට් ක්‍රීඩාවේ සංවර්ධනය උදෙසා මෙවර ද අප සංගමය ආදි ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ සංගමය සමග ඉතා සුහදව අත්වැල් බැඳගෙන කටයුතු කරන ලදි. ඒ වෙනුවෙන් ක්‍රිකට් පුහුණුකරු දීමනාව ලෙස පසුගිය වසරේ මෙන්ම මෙවරද මසකට රු.20,000/- බැගින් වසර

පුරාවට රු.240,000/- ක මුදලක් ද, 2024 මහා ක්‍රිකට් තරගය වෙනුවෙන් රු. 250,000/- ක මුදලක් ද, අප සංගමය විසින් ආදි ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ සංගමය වෙත පරිත්‍යාග කරන ලදි.

2024 මහා ක්‍රිකට් තරගය වෙනුවෙන් ආදි ශිෂ්‍ය සංගමයේ සම්බන්ධීකරණයෙන් කොරියන් ස්පා ආයතනයේ සභාපති කීර්තිමත් ආදි ශිෂ්‍ය අනුරත් අබේරත්න මහතා විසින් කරන ලද රු. 1,000,000/- ක අනුග්‍රාහකත්වයක් ද නැවුරබ් සමූහ ව්‍යාපාරයේ සභාපති කීර්තිමත් ආදි ශිෂ්‍ය තිස්ස ඉලේපෙරුම මහතා රු. 1,000,000/- ක අනුග්‍රාහකත්වයක් ද, රෝයල් සෙරමික් ලංකා ආයතනයෙන් (Rocell) රු. 250,000/- ක අනුග්‍රාහකත්වයක් ද, ආදි ශිෂ්‍ය සංගමයේ උප සභාපති මැග්ස්ටීල් ආයතනයේ කළමනාකරණ අධ්‍යක්ෂක මධුසංක නාමසේන මහතා රු. 100,000/- ක අනුග්‍රාහකත්වයක් ද ලබා දෙන ලදි.

## ❖ <u>රගර් ක්‍රීඩා සංවර්ධනය</u>

දිනෙන් දින ජයග්‍රහණය ගෙන දෙමින් පාසලට කීර්තියක් ගෙනෙන පාසල් රගර් කණ්ඩායමේ උන්නතිය වෙනුවෙන් නිරතුරුව කැප වන අප සංගමය මෙම කාල සීමාව තුළ දී ද, පුහුණුකරු දීමනාව වශයෙන් මසකට රු.10,000/- බැගින් හා ක්‍රීඩා උපකරණ ලබා දෙමින් දායකත්වය දරන ලදි.

## ❖ <u>අන්තර්ශ්‍රේණි දැනුම මිනුම තරගාවලිය</u>

ආදි ශිෂ්‍ය දිනය සැමරීම වෙනුවෙන් වාර්ෂිකව සංවිධාන කරනු ලබන අන්තර්ශ්‍රේණි දැනමු මිනුම තරගාවලිය මෙවර 2023 ඔක්තෝම්බර් මස 25 වන දින විද්‍යාලයේ දී පවත්වන ලද අතර මෙම තරගාවලිය ඉතිහාසයේ ප්‍රථම වරට අප සංගමය විසින් තවත් ඉදිරි පියවරක් තබමින් බහු මාධ්‍ය (Multimedia) තාක්ෂණය ඔස්සේ වඩාත් ආකර්ෂණීය ලෙස පැවැත්වීමට හැකි විය. ප්‍රශ්න සහ පිළිතුරු පත්‍ර සකසා මෙම තරගාවලිය සාර්ථක කර ගැනීම වෙනුවෙන් මූලිකත්වය ගත් අප සංගමයේ සංස්කාරක මනෝජ් ප්‍රසන්න පීරිස් මහතා සහ විනිශ්චය මණ්ඩලයේ මූලිකත්වය ගත් අප සංගමයේ නීති උපදේශක සුදේශ් චතුර ප්‍රනාන්දු මහතාවත් ස්තූති පූර්වකව සිහිපත් කරමු. තවද තරග සංවිධානය කළ උප සභාපති නුවන් රණමයුර, උප සභාපති කුමාරසිරි බෝදරගමගේ, සමාජ කටයුතු ලේකම් චන්න ධම්මික, විධායක කමිටු සාමාජිකයන් වන සුරේෂ් ප්‍රනාන්දු සහ නදුන් ජයසේකර යන මහත්වරුන් දක්වන ලද දායකත්වය ද ස්තූති පූර්වකව සිහිපත් කරමු.

ආදි ශිෂ්‍ය දිනයට සමගාමීව පවත්වනු ලබන දැනුම මිනුම තරගාවලිය 1988 තරම් වූ දුර ඉතිහාසයකට දිවෙන අතර, එහි ආරම්භක සාමාජිකයෙකු වූ හිටපු අනුශාසක/උප සභාපති නැසී ගිය ටිඩී අමරසේකර මහතා සිහිවීම පිණිස ඔහුගේ පුතුන් වන විධායක සභික ලිෂාන් අමරසේකර

හා කංජුල අමරසේකර සොයුරන් තරගාවලියේ ජයග්‍රාහකයන්ට පිරිනැමීමට සහතික පත්‍ර සහ පදක්කම් සඳහා පූර්ණ මූල්‍ය අනුග්‍රාහකත්වය දැක්වූ අතර ඒ පිළිබඳව ඔවුන් හට සංගමයේ ගෞරව ස්තූතිය පළ කර සිටිමු.

තරගාවලිය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය වූ ෆයිල් කවර සහ පිළිතුරු පත්‍ර සඳහා අනුග්‍රාහකත්වය කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය දක්වන ලද අතර එය සම්බන්ධීකරණය කළ කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති මලිත් උපමාල් මහතා හා ඒවා මුද්‍රණ කටයුතු කර දුන් සංගමයේ විධායක සභික රුචිර ගොරකාන මහතාව ද ගෞරවයෙන් සිහිපත් කරමු. තවද, තරගාවලිය සාර්ථක කර ගැනීම වෙනුවෙන් විද්‍යාලයේ විදුහල්පති රවීන්ද්‍ර පුෂ්පකුමාර මහතා ද දැනුම මිනුම සංගමය භාර ආචාරිනී මධුවන්ති කුලසේකර ගුරුතුමිය දැක්වූ දායකත්වය ද තරඟ සඳහා දරුවන් සම්බන්ධ කිරීමේදී අංශ ප්‍රධාන ගුරුවරුන් දැක්වූ දායකත්වය ද ගෞරවයෙන් යුතුව සිහිපත් කරමු. තවද විද්‍යාලයීය ශිෂ්‍ය නායක මණ්ඩලයේ දිනිත් පැහැසර, උදාන්ත ශ්‍යාමාල් සහ අවීන් සසංජන ප්‍රමුඛ ශිෂ්‍ය නායක පුතුන් සහ විද්‍යාලයීය ඡායාරූප සංගමය වෙනුවෙන් මෙම තරග අවස්ථාව ඡායාරූප ගත කළ සිතුක කැටිපෙආරච්චි පුතුණුවන්ටත් අපගේ විශේෂ ස්තූතිය පිරිනමමු.

## ❖ අන්තර්ශ්‍රේණි කථික තරගාවලිය

ආදි ශිෂ්‍ය දිනය සැමරීම වෙනුවෙන් වාර්ෂිකව සංවිධානය කරනු ලබන අන්තර්ශ්‍රේණි කථික තරගාවලිය මෙවර ද පවත්වන ලද අතර ඒ වෙනුවෙන් විනිශ්චය සඳහා සහභාගී වූ පානදුර නීතිඥ සංගමයේ සාමාජිකයින් ද අප ස්තූතිය පුද කරන ලද අතර දැක්වූ සහයෝගයට ද පාසල් පරිපාලනයට ද සංගමයේ ස්තූතිය ද පුද කර සිටිමු.

## ❖ සමස්ථ ලංකා ඉංග්‍රීසි මාධ්‍ය විවාද තරගාවලිය

විද්‍යාලයේ ඉංග්‍රීසි සාහිත්‍ය සංගමය මගින් සංවිධානය කරනු ලැබූ සමස්ත ලංකා ඉංග්‍රීසි මාධ්‍ය විවාද තරගාවලිය සඳහා මූල්‍ය දායකත්වය ලබා දීම සහ විනිශ්චය මණ්ඩලය සම්බන්ධීකරණය කිරීම අප සංගමය මගින් සිදු කරන ලදී. මෙහිදී South Asian Techonologies ආයතනයෙන් අනුග්‍රාහකත්වය ලබා දීම වෙනුවෙන් එම ආයතනයට ස්තූතිය පුද කරන අතර එම ආයතනයේ මූල්‍ය කළමනාකාර අප සංගමයේ හිටපු සභාපති හා වත්මන් උපදේශක මහේෂ් ෆොන්සේකා මහතාට අප ස්තූතිය පුද කර සිටිමු. තවද, විනිශ්චයකාරවරුන් ලෙස සහභාගී වූ පානදුර අධිකරණයේ නීතිඥවරුන් හා එම කටයුතු සම්බන්ධීකරණය කළ ගරු උප සභාපති සුමේධ පෙරේරා මහතාටත් ස්තූතිය සිදු කර සිටිමු.

## ❖ වැඩිහිටි සහ ළමා නිවාස සඳහා දානමය පුණ්‍ය කර්මය

2023 ඔක්තෝම්බර් මස 28 වන දිනට යෙදුණු ආදි ශිෂ්‍ය දිනයට සමගාමීව වාර්ෂිකව සිදු කරනු ලබන දානමය පුණ්‍ය කර්මය මෙම වසර තුළ දී ද වැඩිහිටි නිවාස තුනක් සහ ළමා නිවාස දෙකක් සම්බන්ධ කර ගනිමින් පවත්වන ලදි. වෑකඩ සුජාතා වැඩිහිටි නිවාසය, බණ්ඩාරනායක මාවත වැඩිහිටි නිවාසය, පිංවත්ත සිසිල වැඩිහිටි නිවාසය, සඳහා දානය පරිත්‍යාග කරන ලදි. තවද මොරවින්න බාලිකා නිවාසය, නල්ලූරුව අරුණ ළමා නිවාසය සඳහා දානය ද පරිත්‍යාග කරනු ලැබීය. මෙම පුණ්‍ය කර්ම කටයුත්ත සඳහා ආදි ශිෂ්‍ය සංගමයේ මූල්‍ය පරිත්‍යාගයට අමතරව දැනට ඇමරිකා එක්සත් ජනපදයේ පදිංචිව සිටින දුල්ෂාන් ද සිල්වා මහතා ද මූල්‍ය පරිත්‍යාගයක් පිරිනමන ලදි. ඒ මහතාට සංගමයේ ස්තූති පූර්වක පුණ්‍යානුමෝදනාව පිරිනමමු.

තවද දුල්ෂාන් ද සිල්වා මහතා සංගමය සමග සම්බන්ධීකරණය කළ විධායක සභික ලිෂාන් අමරසේකර මහතා සහ දානමය කටයුතු සියල්ල සංවිධානය කළ සංගමයේ සංස්කාරක විශ්ව ජයතුංග මහතාවත්, ස්තූති පූර්වකව සිහිපත් කරමු.

## ❖ ආදි කතෘ දිනය

අප විද්‍යාලයේ 115 වන ආදි කතෘ දිනය සමරමින් සංවිධානය කරනු ලැබූ සර්ව රාත්‍රික පිරිත් සජ්ජායනය හා සාංඝික දානමය පුණ්‍යකර්මය සඳහා රු. 500,000/- ක පමණ මුදලක් මෙවර ආදි ශිෂ්‍ය සංගමය විසින් පාසලට පරිත්‍යාග කරන ලදි.

තවද විදුහල්පති තුමාගේ ඉල්ලීම පරිදි ශ්‍රී සුමංගල විද්‍යාලය බිහි වීම පිටුපස තිබූ නිවැරදි ඉතිහාසය සහ එහි ගමන් මග පිළිබඳව සංගමයේ ගරු උප සභාපති අමිල නාවලගේ මහතා විසින් පාසල් දරුවන්ට වටිනා දේශනයක් පවත් වන ලදී.

## ❖ සාමාජික ප්‍රවර්ධනය

2023/2024 පරිපාලන වර්ෂය තුළ නව සාමාජිකයින් 27 දෙනෙකු හට සාමාජිකත්වය පිරිනමා ඇති අතර, ඔවුන් සංගමයට බඳවා ගනිමින් සංගමයේ සාමාජික පදනම ශක්තිමත් කිරීම සඳහා දායකත්වය දැක්වූ සියලු විධායක සභිකයන් හට ස්තූතිය පුද කරමු.

## ❖ ආදි ශිෂ්‍ය සුහද හමුව

ආදි ශිෂ්‍යයින් එක් රැස් කිරීම සඳහා මෙවර ද වාර්ෂික සුහද හමුවක් වාද්දුව BLUE WATERS හෝටල් පරිශ්‍රයේ දී සංවිධානය කළ අතර ඒ සඳහා 400 කට අධික සාමාජිකයින් සංඛ්‍යාවක් සහභාගී විය. මේ සඳහා මූල්‍ය අනුග්‍රහකත්වය දැක්වූ සුපර් ෆැෂන් ආයතනය, අමා ෆැෂන් ආයතනය, ස්ටාලයින් එන්ටර්ප්‍රයිසස්, පෑන් ඒෂියා බැංකුව, රොසෙල් සමූහ ව්‍යාපාරය, සිංගර් ෆයිනෑන්ස් ආයතනය සිහිපත් කරන අතර Freeze සංගීත කණ්ඩායම හා Sway Dancers කණ්ඩායම මෙහිදී සුහද හමුව වර්ණවත් කරන ලදි. මෙහිදී මූලිකත්වය ගෙන කටයුතු කළ උප සභාපති දිලීක මධුරංග මහතාටත්, උප සභාපති චමත් ඩයස් මහතාටත්, කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති මලිත් සිල්වා මහතාටත් අනුග්‍රාහක බවතුන් සම්බන්ධ කර දුන් ගරු උප සභාපති අමිල නාවලගේ මහතාටත් ස්තූතිය පුද කරන අතර ටිකට් පත් අලෙවි කිරීමෙන් සහ සුහද හමුව සාර්ථක කර ගැනීමට නන් අයුරින් සහයෝගය දැක්වූ සියලුම සාමාජිකයින්ටත් අප ස්තූතිය පුද කර සිටිමු.

## ❖ ප්‍රජා සේවාවන්

- මෙම වසරේ දී ද පෙර වසරවල් වල මෙන්ම දැවැන්ත ලේ දන් දීමේ පුණ්‍යකර්මයක් සංවිධානය කර ලේ සාම්පල සියයකට අධික ප්‍රමාණයක් කේතුමතී රෝහලේ ලේ බැංකුවට ලබා දීමට හැකි වීම හා පරිත්‍යාගශීලින් ඇගයීම.

- කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය සහ ආදි වෛද්‍ය වෘත්තිකයන්ගේ සංගමය එක්ව ආදි ශිෂ්‍ය දිනයට සමගාමීව පාසලේ ශිෂ්‍යයින්, ආදි ශිෂ්‍යයින්, ගුරුවරුන්, ආදි ගුරුවරුන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් වෙනුවෙන් වෛද්‍ය සායනයක් පැවැත්වීම.

- මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි විසින් පානදුරා වාදය පවත්වා වසර 150ක් පිරීම හේතුවෙන් පවත්වන ලද ගුණ සැමරුම් උත්සවය සඳහා දහසකට අධික ප්‍රමාණයකට කිරි පැකට් ලබා දීම වෙනුවෙන් රු. 66,810/- ක මුදලක් වැය විය.

- පානදුර අවට වැඩිහිටි නිවාස හා ළමා නිවාසවලට ආහාරපාන ලබා දීම.

- පාසලේ ගණිත අංශයෙන් 2022 උසස් පෙළ විභාගයට පෙනී සිටිමින් කළුතර දිස්ත්‍රික්කයේ 3 වන ස්ථානය ගෙන පාසලේ ඉහළම දක්ෂතාවය දැක්වූ (Z-score: 2.541) විරංග රන්දුනු


ජයවර්ධන ශිෂ්‍යයා වෙනුවෙන් මෙවර ද ස්ටෑන්ඩඩ් චාටඩ් බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී බිංගුමල් තෙවරාතන්ත්‍රී මහතා විසින් ආදි ශිෂ්‍ය සංගමය හරහා ලැප්ටොප් පරිගණකයක් ප්‍රදානය කළ අතර එහි සම්බන්ධීකරණය සිදු කළ විධායක සභික ලිෂාන් අමරසේකර මහතාට මෙහිලා සංගමයේ ස්තූතිය පුද කර සිටිමු.

පසුගිය වසර සාර්ථක කර ගැනීමට අප හට සහය දැක්වූ සංගමයේ සභාපති අරවින්ද පෙරේරා මහතා භාණ්ඩාගාරික ප්‍රභාත් තාරක මහතා, සියලුම උප සභාපතිවරුන්, අනිකුත් විධායක කමිටු සාමාජිකයින් සහ නන් අයුරින් සහයෝගය දැක්වූ සාමාජිකයින් හට ගෞරවනීය ස්තූතිය පුද කර සිටින අතරම අප හා බද්ද වී කටයුතු කළ කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය ඇතුලු අනෙකුත් සියලුම සංගම් වලටත් පාසල් සංවර්ධන සමිතිය ප්‍රමුඛ දෙමව්පියන්ටත් අපගේ ස්තූතිය පුද කර සිටිමු. සියලුම කටයුතුවලදී අප හට සහය දැක් වූ විද්‍යාලයේ විදුහල්පති ප්‍රමුඛ අධ්‍යන හා අනධ්‍යන මහත්ම මහත්මීන්ටත් සංගමයේ ගෞරවනීය ස්තූතිය පුද කරන අතර ඔවුන්ගේ සහයෝගය නොවන්නට ගෙවී ගිය වසර සාර්ථක කර ගැනීමට නොහැකි වනු ඇති බව අපගේ විශ්වාසයයි.

මෙම පරිපාලන වර්ෂය තුළ ආරම්භ වූ බ්‍රිතාන්‍ය ආදි ශිෂ්‍ය සංගම් ශාඛාව මෙහිදී සිහිපත් කරන අතර ඔවුන් ද දැක්වූ සහයෝගය අගය කොට සලකමු.

2023/2024 පරිපාලන වර්ෂයේ සාර්ථකත්වය සඳහා සහය දුන් සැමට ස්තූතිය පුද කරමින් ඉදිරියේ දී අභිනවයෙන් තේරී පත් වන නිලධාරී මණ්ඩලයට ආදි ශිෂ්‍ය සංගමයේ සහ පාසලේ දියුණුව උදෙසා අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

**ස්තූතියි...!**



**දිනේෂ් කැටිපෙආරච්චි මහතා**
**(සම ලේකම්)**



**ධනුක කෝට්ටහච්චි මහතා**
**(සම ලේකම්)**